නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - 2021

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ (පොදු) ශේෂය රු.757,421 ක් වුවත් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ එය රු.1,768,350 ක් ලෙස රු.1,010,929 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | මුදල් හා මුදල් සමාන දෑ නිවැරදි ශේෂය වත්කම් හා වගකීම් ප්‍රකාශයේ නිවැරදිව ඉදිරිපත් කළ යුතුවේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් සහ උපලේඛනවල සඳහන් වටිනාකම් අතර රු.29,233,473 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනසට හේතු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.14,918,707 ක්වූ ගිණුම් විෂයයන් 04 ක් සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. | අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකිරීමට කටයුතු නොකිරීම. | වරිපනම් අයකිරීම සඳහා වන ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 05 ක ඉන්ධන දහන පරීක්ෂා සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 30/2016 3.1 ඡේදය අනුව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අයහාරය රු.7,039,971 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අයහාරය ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.17,445,266 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය බැංකු ජංගම ගිණුමක කොන්ත්‍රාත් අතරුඳවුම් ලෙස 2018 වර්ෂයේ ජනවාරි සිට 2021 නොවැම්බර් දක්වා කාලය තුළ රු.2,002,462 ක මුදලක් පැවති අතර එම අතරුඳවුම් මුදල අදාළ පාර්ශවයන්ට ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් කොන්ත්‍රාත්වල අතරුඳවුම් මුදල් බැවින් ගෙවීම් කිරීම සඳහා තැන්පතු ලෙස රඳවාගෙන ඇත. | මුදල් ආපසු ඉල්ලා අදාළ පාර්ශවයන්ගෙන් කරනු ලබන ඉල්ලීම් ඇති නොවන පරිදි මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පත් රුඳවුම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 2.3 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,672,870 ක හිඟ කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.31,100 ක් අයකරගෙන ඇති අතර රු.7,000 ක් ඇප තැන්පතු මගින් හිලව් කර ඇත. | අයකරගත යුතු සියළු හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.1,423,425 ක බලපත්‍ර ගාස්තු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | හිඟහිටි බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා කඩිනමින් ක්‍රියාකළ යුතුවේ. |
| (ii) | 2019 සහ 2020 වර්ෂ සඳහා ලැබිය යුතු රු.627,000 ක දැන්වීම් පුවරු ආදායමක් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටද කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා අදාළ පාර්ශවයන් වෙත නඩු පවරා ඇත. | අදාළ හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු කඩකාමර 05 ක් කුලියට ලබාදීමට ගිවිසුම්ගතවී වසර 9 – 26 ත් අතර කාලයක් ගතවී තිබුණද, එම ගිවිසුම් අළුත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් වෙන්දේසි කිරීම් වලින් ප්‍රාදේශීය සභාවට ඉඩම් කැබලි 05 ක් ලැබී තිබුණු නමුත් එම ඉඩම්වල වැට මායිම් සකස් කර ඒවා ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | මෙම ඉඩම් වැට මායිම් සකස්කර ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2019 වර්ෂයේදී රු.7,500,000 ක් වියදම් කර කවරක්කුලම මංසන්දියේ ඉදිකරන ලද ආර්ථික මධ්‍යස්ථානය නිෂ්කාර්යට පැවතුණි. | ඉදිරියේදී ඵලදායී ලෙස යොදවා ගැනීමට කටයුතු කරමි. | කඩිනමින් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කීරික්කුලම ප්‍රදේශයේ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණු නමුත් බල ප්‍රදේශය තුළින් එකතු වන කසළ එම මධ්‍යස්ථානයේ ප්‍රතිචක්‍රීයකරණය සිදු නොකිරීම නිසා සභාවට අයත් කසළ අවිධිමත් ලෙස බැහැර කිරීම සිදුවෙමින් පැවතුණි. | බලප්‍රදේශයෙන් ජනනය වන කසළ මේ වනවිට කීරික්කුලම කසළ අංගනයට භාර දෙනු ලැබේ. | බලප්‍රදේශයෙන් එකතුවන ඝණ අපද්‍රව්‍ය ඇතුළු කසළ නිසි පරිදි ප්‍රතිචක්‍රීයකරණය කිරීමට කටයුතු කළ යුතුවේ. |